**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**
**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
**Ministry of Finance**
**State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது<br>My No DSD/HO/06/EP/10/Railway/2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........................................... | දිනය<br>திகதி<br>Date 2021.07.20 |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත.

**දුම්රිය ස්ථානයන් ආශ්‍රිතව සමෘද්ධි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවිසැල් පවත්වා ගෙනයාම.**

මෙම වසරෙහි මුල් මාස කිහිපය තුළ රටෙහි පැවති කොවිඩ් 19 වෛරස් රෝග තත්ත්වය හේතුවෙන් රජය විසින් විටින් විට රට අගුළුලෑම නිසා සහ විටින් විට පැනවූ සංචරණ සීමා හේතුවෙන් ව්‍යවසාය සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සංවර්ධන වැඩසටහන් තාවකාලිකව කල් දැමීමට සිදු විය. වර්තමානය වන විට රට බොහෝ දුරට යහපත් වී ඇති බැවින් නැවතත් ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ආරම්භ කොට පවත්වා ගෙනයාම පිළිබඳව ව්‍යවසාය සංවර්ධන අංශයේ විශේෂ අවධානය යොමු වී ඇත.

මෙහිදී දුම්රිය ස්ථානයන් ආශ්‍රිතව අලෙවිසැල් ඉදිකිරීම සම්බන්ධව DSD/HO/04 – 06/J – M/Circular/2021 හා 2021.03.25 දිනැති ජීවනෝපාය සංවර්ධන හා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන 2021 චක්‍රලේඛයෙහි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2021 හි අංක 02 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

ඒ අනුව කොළඹ කොටුව හා මරදාන යන ප්‍රධාන දුම්රිය ස්ථානයන් දෙක හැර දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි පිහිටා ඇති දුම්රිය ස්ථානයන්හි සමෘද්ධි අලෙවිසැල් පිහිටුවා ඒවායෙහි සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට අවසර ලබා දිය හැකි බව දුම්රිය මූලස්ථාන වෙළඳ හා අලෙවි අංශය මගින් කැමැත්ත පළ කරන බව අප වෙත දන්වා ඇත.

ඒ අනුව දුම්රිය ස්ථානයන්හි සමෘද්ධි කුඩා අලෙවිසැල් ජාලයක් ස්ථාපිත කිරීම තුළින් ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණික නිෂ්පාදන අලෙවි කර ගැනීමට හැකි වන අතර එය සමෘද්ධිලාභීන්ගේ ආර්ථිකය යහපත්වීමට මහත් පිටිවහලක්ද වනු ඇත. එහිදී පහත සඳහන් නිර්නායක කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින් හා රජය, ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශ විසින් කොවිඩ් 19 රෝගයෙන් ආරක්ෂාවීම පිළිබඳව නිකුත් කර ඇති උපදෙස් හා නීති රීති නිසි පරිදි අනුගමනය කරමින් දුම්රිය ස්ථාන තෝරා ගැනීම, අලෙවිසැල් ඉදි කිරීම හා පවත්වා ගෙනයාම සිදු කිරීම මැනවි

.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |

❖ දුම්රිය දෙපාර්තමේන්තුව විසින් අලෙවිසැල් පිහිටුවීම පිළිබඳව මේ වන විටත් දුම්රිය ස්ථානාධිපතිවරුන් හා ප්‍රාදේශීය ප්‍රවාහන අධිකාරීවරුන් දැනුවත් කර ඇති බැවින්, සුදුසු දුම්රිය ස්ථාන තෝරා ගෙන එහි අලෙවිසැල පිහිටුවීම පිළිබඳව දුම්රිය ස්ථානාධිපතිවරුන් සමග සාකච්ඡා කිරීම කළ හැකිය. මේ සඳහා ව්‍යාපෘති කළමණාකරු අනිවාර්යයෙන් සම්බන්ධ කර ගත යුතු අතර සුදුසු වෙනත් නිලධාරීන්ද සහභාගී කර ගනිමින් මූලික සාකච්ඡා වටයක් පවත්වා අවශ්‍ය තීන්දු තීරණ ගැනීම වඩාත් සුදුසු හා ප්‍රායෝගික ද වේ. වෙළඳ සැල පිහිටුවන ස්ථානය පිළිබඳව ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීම අනිවාර්ය වන අතර එය ජනාකීර්ණ දුම්රිය ස්ථානයක්ද යන්න හා ප්‍රමාණවත් වෙළඳ පොලක් සහිත ස්තානයක්ද යන්න පිළිබඳවද විශේෂ අවධානය යොමු කල යුතු වේ.

❖ තෝරා ගන්නා දුම්රිය ස්ථානය තුළ දුම්රිය දෙපාර්තමේන්තුව මගින් හෝ වෙනත් ආයතනයක් මගින් දැනටමත් අලෙවිසැලක් පවත්වා ගෙන යන්නේ නම් ඒවායෙහි අලෙවි කෙරෙන භාණ්ඩ හා නිෂ්පාදන වලට අවහිරයක් නොවන පරිදි සමෘද්ධි නිෂ්පාදන අලෙවි කිරීමට කටයුතු කළ හැකිය.

❖ තෝරා ගන්නා දුම්රිය ස්ථානය තුළ දුම්රිය දෙපාර්තමේන්තුව විසින් භෝජනාගාරයක් පවත්වා ගෙන යන්නේ නම් ඒවායෙහි අලෙවි කෙරෙන ද්‍රව්‍යයන් අලෙවි කිරීමට අවසර ලබා දෙනු නොලැබේ. ඒ අනුව එම අලෙවිසැල් වල අලෙවියට තබා ඇති සමජාතිය නිෂ්පාදන අලෙවි කිරීමෙන් වැලකිය යුතුය.

❖ නිෂ්පාදයන්හි ගුණාත්මක බව හා නැවුම් බව කෙරෙහි නිරතුරු අවධානය යොමු විය යුතු අතර ආහාර පාන වර්ග නම් එය නිෂ්පාදිත දිනය, කල් ඉකුත් වන දිනය වෙළඳ නාමය ආදී පිළිගත් ව්‍යාපාරික කාරණා ඇතුළත් කළ යුතුය. ඔබ සිදු කරනු ලබන ස්ථානීය පරීක්ෂාවේදී මෙම කරුණු පිළිබඳව දුම්රිය ස්ථානාධිපතිවරයා සමග සාකච්ඡා කෙට තීරණයකට එළැඹීමට අවකාශ ඇත.

❖ අලෙවි සැලෙහි අලෙවිය සඳහා තබන නිෂ්පාදන ලයිස්තුවක් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතු හෙයින් ඔබ විසින් අලෙවි කිරීමට යෝජිත නිෂ්පාදන ලයිස්තුවක් හා ව්‍යවසායකයින් පිලිබඳ තොරතුරු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවසාය සංවර්ධන අංශය වෙත කඩිනමින් ලබා දීමට කටයුතු කළ යුතුය. මන්දයත් එම ලයිස්තුව දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු බැවිනි. (ඒ සඳහා 0112887013 ෆැක්ස් අංකය හෝ email ලිපිනය භාවිත කරන්නේ නම් මැනවි)

❖ තෝරා ගන්නා දුම්රිය ස්ථානයට පහසුවෙන් ළඟා විය හැකි ප්‍රදේශයක පදිංචි සමෘද්ධි ව්‍යවසායකයෙකුට හෝ කණ්ඩායමකට හෝ ව්‍යාපාරික සංගමයකට අලෙවිසැලෙහි වගකීම පැවරීම පිළිබඳව අවධානය යොමු කිරීම වඩාත් සුදුසුය.

❖ රජය, ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශ හා දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් කොවිඩ් 19 රෝගයෙන් ආරක්ෂාවීම පිළිබඳව හා අනෙකුත් කාරණා පිළිබඳව පනවනු ලබන නීති රීති, උපදෙස් හා මග පෙන්වීම් හා රෙගුලාසි නිසි පරිදි අනුගමනය කිරීම සඳහා තෝරා ගන්නා ව්‍යාපාරිකයා, කණ්ඩායම හෝ ව්‍යාපාරික සංගමය දැනුවත් කිරීම නිරතුරුව සිදු කළ යුතුය. එමෙන්ම අලෙවිසැල තුළ හා ගනුදෙනු කටයුතු වලදී සෞඛ්‍යාරක්ෂිත ක්‍රම අනුගමනය කිරීම, අලෙවිසැල තුළ හා අවට පරිශ්‍රය පිරිසිඳුව තබා ගැනීම ආදිය කෙරෙහි අවධානය යොමු කරවීමට අලෙවිසැල පවත්වා ගෙන යනු ලබන ව්‍යවසායකයින් දැනුවත් කළ යුතුය.

❖ ස්ථාපිත කෙරෙන අලෙවි සැල වර්ග අඩි 10 x 10ක ප්‍රමාණය නොයික්ම විය යුතුය. එහි දළ සැකැස්ම මේ සමග ඔබ වෙත යොමු කෙරෙන අතර එහි ආකෘතිය තොරතුරු තාක්ෂණ අංශය විසින් පවත්වා ගෙන යනු ලබන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි හා ව්‍යවසාය සංවර්ධන අංශයේ WhatsApp group වෙතද යොමු කොට ඇත. අලෙවි කුටිය නිර්මාණය කිරීමට අවශ්‍ය උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

❖ මේ සම්බන්ධව සකස් කරන ලද කුඩා ව්‍යාපෘති වාර්තාවක් අප වෙත යොමු කිරීමද අනිවාර්ය වේ.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් සහ ඒ ඒ ප්‍රදේශයන්ට ආවේනික නිෂ්පාදන පිළිබඳව ඔබගේ පූර්ණ අවධානය යොමු කරමින් ***පළමුව ,අලෙවිය සඳහා සුදුසු භාණ්ඩ ලයිස්තුව*** පහත වගුවට අනුව කඩිනමින් අප වෙත යොමු කරන්නේ නම් මැනවි. මේ පිළිබඳව ඔබගේ පෞද්ගලික අවධානය යොමු වනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වන අතරම මේ පිළිබඳව ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/ තෝරා ගනු ලබන දුම්රිය ස්ථානය | ව්‍යවසායකයාගේ නම | ලිපිනය | දුරකථන අංකය | අලෙවිය සඳහා යොමු කෙරෙන නිෂ්පාදන වර්ගයන් |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

එම්. ජී. එස්. එස්. කිත්සිරි
අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන අංශය) වැ.ආ.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.